**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## මධ්‍යම රජයේ ආයතන වෙත භාණ්ඩ හා සේවා සපයනු ලබන සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් වෙත කෙරෙන දැනුම්දීමයි

**2025.07.17** දිනැති අංක **02/2025** දරන **රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය** යටතේ නිකුත් කර ඇති උපදෙස්වලට අනුව, රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් සිදු කරනු ලබන භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනයන් සඳහා **2026 ජූලි 01 දින සිට** නිල වශයෙන් භාවිතා කරනු ලබන්නේ ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) හරහා ජනනය කරනු ලබන ඇණවුම් පත්‍ර (Purchase Orders - PO) පමණි.

කෙසේ වෙතත්, වළක්වා ගත නොහැකි හේතුවක් නිසා මෙම චක්‍රලේඛය බලපැවැත්වෙන දිනය **2026 ඔක්තෝබර් 01** ලෙස සංශෝධනය කිරීමට සිදුවන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ අනුව, **2026 ඔක්තෝබර් 01** දිනෙන් පසුව, මධ්‍යම රජයේ ආයතන වෙත භාණ්ඩ හා සේවා සැපයීම වෙනුවෙන් ගෙවීම් කරනු ලබන්නේ ITMIS පද්ධතිය හරහා ජනනය කරන ලද ඇණවුම් පත්‍ර (POs) මගින් ඇණවුම් කරන ලද භාණ්ඩ හා සේවා සඳහා පමණි.

එබැවින්, මධ්‍යම රජයේ ආයතන වෙත භාණ්ඩ හා සේවා සපයන සියලුම සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට වගබලා ගත යුතුය:

- තමන් වෙත ලැබෙන ඇණවුම් පත්‍ර ITMIS පද්ධතිය හරහා ජනනය කරන ලද නිල ඇණවුම් පත්‍ර බව තහවුරු කර ගැනීම,
- ඊට අනුකූලව අදාළ භාණ්ඩ හා සේවා සැපයීම සිදු කිරීම, සහ
- 2026 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන මෙම නව පද්ධතියට අනුකූල වන පරිදි තම ව්‍යාපාරික ක්‍රියාවලීන් සැලසුම් කර ගැනීම.

මෙම පද්ධතිය මගින් රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය වඩාත් පාරදෘශ්‍යභාවයකින්, කාර්යක්ෂමතාවයකින් සහ වගවීමකින් යුතුව සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

**අධ්‍යක්ෂ ජනරාල්**
**රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව,**
**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.**